# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,153 — 1960 ජූලි 1 වැනි සිකුරාදා — 1.7.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# IV වැනි කොටස — පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයක් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 131 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | 137 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපළ විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 135 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | — |


## පළාත් පාලන නිවේදන

ඇල්.ජී.ඩී.—බීසී 568

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වැනි පරිච්ඡේදයේ) 22 වැනි වගන්තිය යටතේ ඒ සඳහා නියමිත බල මණ්ඩලය විසින්—එනම්: කෑකිරාව සුළු නගර සභාව විසින් සම්පාදිතව, 1947 ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයෙන් පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තිය යටතේ පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් ස්ථිර කරණ ලද නියෝග.

වී. සී. ජයසූරිය,<br>
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ<br>
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර<br>
ලේකම් තැන.

1960 මැයි මස 30 වැනි දින,<br>
කොළඹ දීය.

**නියෝග**

1. මේ නියෝගවල—

"සභාපති තුමා" යනුවෙන් සුළු නගර සභාවේ සභාපති තුමා අදහස් කරනු ලැබේ.

"සුළු නගර සභාව" යනුවෙන් කෑකිරාව සුළු නගර සභාව අදහස් කරනු ලැබේ.

"මස් පිණිස සතුන් මරණ ස්ථානය" යනුවෙන් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත්කරණ ලද මස් පිණිස සතුන් මරණ පොදු ස්ථානය අදහස් කරණු ලබන අතර, ඊට මස් පිණිස සතුන් මැරීම සඳහා සුළු නගර සභාව විසින් නියම කරණු ලබන ස්ථානයක් ඇතුළත් කරණු ලැබේ.

2. මස් පිණිස සතුන් මරණ සෑම ස්ථානයක්ම සුළු නගර සභාවේ සෞඛ්‍ය පරීක්ෂක තැන භාරයේ තිබිය යුතුයි. එකී සෞඛ්‍ය පරීක්ෂක වරයා විසින් එම සතුන් මරණ ස්ථානයෙහි මනා පරිපාලනය හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේය.

3. (1) කිසිම අයෙකු විසින් කිසිම සතෙකු—

(අ) ඒ සතා පරීක්ෂාකර බැලීම පිණිස සුළු නගර සභාව විසින් පත්කරණ ලද නිලධාරියා විසින් පරීක්ෂාකොට මිනිසුන්ගේ ආහාර පිණිස මරණු ලැබීමට සුදුසුයයි අනුමතකර තිබේනම්, හෝ

(ආ) පූර්වභාග 7 ටත් 9 ටත් අතර කාලයේදී හෝ මිස නැත්නම් සතුන් මරණ ස්ථානයේදී නොමැරිය යුතුයි. එහෙත් කවර අවස්ථාවකදී වුවත් මෙහි සඳහන් වේලාවට වඩා වෙනස්වූ යම් වේලාවක යම් සතෙකු මැරීම සඳහා සභාපති තුමා විසින් බලය දෙනු ලැබිය හැකි වන්නේය.

(2) කිසිම අයෙකු විසින් කිසිම සතෙකු—

(අ) (1) වැනි පරිච්ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමත කළ වේලාවේ සිට පැය 72ක කාලයක් ගතවූ වාට පසු මොනයම් වේලාවක, හෝ

(ආ) (1) වැනි පරිච්ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා සතුන් මරණ ස්ථානයට අයත් භූමියෙන් පණ පිටින් ඉවත්කර ඇත්තේනම්, හෝ

ඒ සතා නැවතත් පරීක්ෂාකොට බලා මනුෂ්‍යාහාර පිණිස මරණු ලැබීමට සුදුසුයයි (1) වැනි ඡේදය යටතේ අනුමත කරණ ලද්දේ නම් මිස නැතිනම් සතුන් මරණ ස්ථානයේදී නොමැරිය යුතුයි.

4. සතුන් මරණ ස්ථානයකට යම් සතෙකු ගෙන එන සෑම අයෙකු විසින්ම ඒ සතා සතුන් මරණ ස්ථානයට අයත් භූමිභාගයෙහි නවත්වා සිටින කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම, බීම නිසැකවම ලැබීමට අවශ්‍යවූ සෑම පිළිවෙතක්ම යෙදිය යුතුයි.

5. සතුන් මරණ ස්ථානයකට යම් සතෙකු ගෙන එන සෑම අයෙකු විසින්ම ඒ සතා මරණු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කරණ ලද්දේ නම් එසේ ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා එම භූමිභාගයෙන් ඉවත් කළ යුතුයි. නැතහොත් ඉවත් කරවිය යුතුයි.

6. යම් සතෙකු 3 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසුයයි අනුමත කළායින් පසු ඒ සතා රෝගීබව හෝ මනුෂ්‍යාහාර පිණිස මරණු ලැබීමට නුසුදුසු බව හෝ පෙනී ගියහොත් සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරියා විසින් හෝ 3 වැනි නියෝගයේ සඳහන් නිලධාරියා විසින් හෝ ඒ සතා මැරීම තහනම් කරණු ලැබිය හැකි වන්නේ ය.

7. සතුන් මරණ ස්ථානයේදී මරණ ලද යම් සතෙකුගේ මස් හෝ අතුනුබහන් ආදිය සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමාගේ හෝ 3 වැනි නියෝගයේ සඳහන්වූ නිලධාරියාගේ හෝ කල්පනාවේ හැටියට රෝගීව හෝ මනුෂ්‍යාහාරයට නුසුදුසුව තිබේනම් ඔහු විසින් ඒ මස් හෝ අතුනුබහන් ආදිය වහාම විනාශකර දැමීමට සැලැස්විය යුතුයි. එසේ නැතහොත් ඒ මස් හෝ අතුනුබහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම හෝ වලකින අන්දමින් ඉවත් කරවිය යුතුයි.

8. සතුන් මරණ ස්ථානය භාරවූ නිලධාරියා විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස මරණු ලැබීමට සුදුසුයයි අනුමත කර නැත්තාවූ හෝ 6 වැනි නියෝගයේ විධිවිධාන පරිදි මැරීම තහනම් කර තිබෙන්නාවූ හෝ කිසිම සතෙකු මස් පිණිස මැරීමට අවසර නොදිය යුතුයි.

9. (1) කිසිම අයෙකු විසින් මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුයයි 7 වැනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනුබහන් ආදියක් සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරියාගේ හෝ 3 වැනි නියෝගයේ සඳහන්වූ නිලධාරියාගේ නියමය යටතේ මිස නැතිනම් සතුන් මරණ ස්ථානයෙන් ඉවත් නොකළ යුතුයි.

(2) කිසිම අයෙකු විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරණ ලද යම් සතෙකුගේ කුණපය, ඒ කුණපයේ ඉස්සරහ ගාත් වලත් පස්සා ගාත් වලත් සතුන් මරණ ස්ථානය භාරවූ නිලධාරි තැන විසින් "කෑකිරාව සුළු නගර සභාව" යන මුද්‍රාව පිහිටුවා තිබේනම් මිස නැතිනම් සතුන් මරණ ස්ථානයෙන් ඉවත් නොකළ යුතුයි.

10. වෙනත් යම් සතෙකු ඉදිරියේදී හෝ ඒ ස්ථානයෙහි කලින් මරණ ලද සෑම සතෙකුගේම කුණපය ඉවත් කර හෝ මුවාකර හෝ එම ස්ථානය ශුද්ධ පවිත්‍ර කරණ තුරු හෝ කිසිම සතෙකු නොමැරිය යුතුයි.

11. (1) සතුන් මරණ ස්ථානය පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් වන අන්දමේ ගාස්තුවක් සුළු නගර සභාවට කලින් ගෙවිය යුතුයි. එකී ගාස්තුව ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් සුළු නගර සභා කාර්‍යාලයෙන් නිකුත් කළ කුවිතාන්සියක් නැතිව කිසිම සතෙකු මැරීමට ඉඩ නොදිය යුතුයි:—

එළුවන්, හෝ බැටළුවන් සඳහා එකෙකුට ... රු. 1.00

(2) මිනිසුන්ගේ ආහාරය පිණිස මරණු ලැබීමට සුදුසුයයි 3 වැනි නියෝගය යටතේ සතෙකු අනුමත කර තිබෙනවිට ඒ සතා මස්මඩුවට ඇතුල් කිරීමට ප්‍රථමයෙන් ගාස්තුව ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් සුළු නගර සභාවෙන් නිකුත් ගළ කුවිතාන්සිය පෙන්වා සිටීම අවශ්‍ය නොවන්නේ ය.

12. සතුන් මරණ ස්ථානය භාරකරු විසින් සතුන් මරණ ස්ථානයට ගෙන එන ලද සියලුම සතුන් පිළිබඳ ලේඛණයක් මෙහි පහත සඳහන් ආකෘති පත්‍රයේ ප්‍රකාරයට අනුව තබාගත යුතු වන්නේ ය.

| හරක් කුවිතාන්සියේ අංකය | විස්තර | පාට | වයස | හං නිවරණ | | මස්මරන්නාගේ නම | ගව කොටුවට ඇතුල්කළ වේලාව සහ දිනය | පරීක්ෂා කර බැලූ දිනය | ගෙනගිය දිනය | බැහැර කරන්ඩ | ගවයන් භාරගත් නිලධාරියාගේ කෙටි අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | දකුණු පැත්ත | වම පැත්ත | | | | | | |
| | | | | | | | | | | | |

---

ඇල්. ජී. ඕ.—බිසී 575.

## වවුනියා සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වැනි පරිච්ඡේදයේ) 22 වැනි වගන්තිය යටතේ විධි වූ බල මණ්ඩලය විසින් එනම්, වවුනියා සුළු නගර සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ "ගැසට්" අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් ස්ථිර කරන ලද නියෝග.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය
කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960ක් වූ ජනවාරි මස 6 වැනි දින,
කොළඹදීය.

### නියෝග

1. ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ ප්‍රකාශ කරන ලද පොදු සතුන් මරණ ස්ථානය වවුනියාවේ පශු ශල්‍ය වෛද්‍යවරයා භාරයේ තිබිය යුතුය. ඒ සතුන් මරණ ස්ථානයේ මනා පරිපාලනය හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන් ඒ නිලධාරිතුමා විසින් වගකිය යුතුයි.

2. (1) කිසිම අයකු විසින් කිසිම සතකු—

(අ) සුළු නගර සභාව විසින්, ඒ සඳහා පත්කරන ලද නිලධාරියා විසින්, පරීක්ෂාකොට ඒ සතා මිනිසුන්ගේ ආහාර පිණිස මරණු ලැබීමට සුදුසු යයි අනුමත කර තිබේ නම්; හෝ

(ආ) පූර්වභාග 7ත් පූර්වභාග 9ත් අතර කාලයේදී හෝ මිස නැත්නම් සතුන් මරණ ස්ථානයේදී නොමැරිය යුතුයි. එහෙත් කවර අවස්ථාවකදී වුවත් මෙහි සඳහන් වේලාවට වඩා වෙනස් වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා සභාපතිතුමා විසින් බලය දිය හැකිය.

(2) කිසිම අයකු විසින් කිසිම සතකු—

(අ) (1) වෙනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමත කළ වේලාවේ සිට පැය 30ක කාලයක් ගතවුවාට පසු කොයියම් වේලාවක ; හෝ

(ආ) (1) වෙනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා සතුන් මරණ ස්ථානයට අයිති භූමියෙන් පණ පිටින් ඉවත් කර ඇත්තේ නම් ඒ සතා නැවතත් පරීක්ෂා කොට මිනිසුන්ට ආහාර පිණිස මැරීම සුදුසු යයි එම ඡේදය යටතේ අනුමත කරන ලද්දේ නම් මිස නැත්නම් මරණ ස්ථානයේදී නොමැරිය යුතුයි.

3. සතුන් මරණ ස්ථානයට යම් සතකු ගෙන එන සෑම අයකු විසින්ම ඒ සතා සතුන් මරණ ස්ථානයට අයිති භූමියෙහි නවත්වා තබන කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම, බීම නිසැකව ලැබීම සඳහා අවශ්‍ය වූ සෑම පිළිවෙතක්ම යොදා ගත යුතුයි.

4. සතුන් මරණ ස්ථානයක යම් සතකු ගෙන එන සෑම අයකු විසින්ම ඒ සතා මැරීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂෙප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂෙප කළ වහාම ඒ සතා ඒ ස්ථානය පිහිටි භූමියෙන් ඉවත් කළ යුතුයි. නැතහොත් ඉවත් කරවිය යුතුයි.

5. යම් සතකු 2 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ට ආහාර පිණිස මැරීම නුසුදුසු බව පෙනී ගියොත් ප්‍රදේශයේ සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරියා විසින් හෝ 2 වැනි නියෝගයේ සඳහන් නිලධාරියා විසින් හෝ ඒ සතා මැරීම තහනම් කළ හැකියි.

6. සතුන් මරණ ස්ථානයේදී මරණ ලද යම් සතකුගේ මස් හෝ අතුනුබහන් ආදිය සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරියාගේ හෝ 2 වැනි වගන්තියේ සඳහන් වූ නිලධාරියාගේ හෝ කල්පනාවේ හැටියට ලෙඩ සහිතව හෝ මිනිසුන් ගේ ආහාරයට නුසුදුසුව තිබේ නම් ඔහු විසින් ඒ මස් හෝ අතුනුබහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම හෝ වළකින අන්දමින් ඒවා එම ස්ථානයෙන් ඉවත් කරවිය යුතුයි.

7. සතුන් මරණ ස්ථානය භාරවූ නිලධාරියා විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස මැරීම සුදුසු යයි අනුමත කර නැත්තාවූ හෝ 5 වැනි නියෝගයේ විධිවිධාන පරිදි මැරීම තහනම් කර තිබෙන්නාවූ හෝ කිසිම සතකු මැරීමට අවසර නොදිය යුතුයි.

8. (1) කිසිම අයකු විසින් මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු යයි 6 වැනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනුබහන් ආදියක් ප්‍රදේශයේ සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරියා ගේ හෝ 2 වැනි නියෝගයේ සඳහන් වූ නිලධාරියාගේ හෝ නියමය යටතේ මිස නැත්නම් සතුන් මරණ ස්ථානයෙන් ඉවත් නොකළ යුතුයි.

(2) කිසිම අයකු විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණපය, ඒ කුණපයේ ඉස් සරභා ගාත්වලත් පස් සා ගාත්වලත් සතුන් මරණ ස්ථානය භාරවූ නිලධාරියා විසින් ඒ ඒ කාරණයේ හැටියට, "ඊ. සී. වී. බීෆ්", "ඊ. සී. වී. මටන්", "ඊ. සී. වී. පෝර්ක්", යන සලකුණු පිහිටුවා තිබේ නම් මිස නැත්නම් සතුන් මරණ ස්ථානයෙන් ඉවත් නොකළ යුතුයි.

9. වෙනත් යම් සතකු ඉදිරියේදී හෝ ඒ ස්ථානයෙහි කලින් මරණ ලද සෑම සතකුගේම කුණපය ඉවත් කර හෝ මුවාකර ස්ථානය ශුද්ධ පවිත්‍ර කරන තුරු හෝ කිසිම සතකු නොමැරිය යුතුයි.

10. (i) සතුන් මරණ ස්ථානය පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් වන අන්දමේ ගාස්තුවක් සුළු නගර සභාවට කලින් ගෙවිය යුතුයි. ගාස්තුව ගෙවූ බවට සාක්ෂ්‍යයක් වශයෙන් සුළු නගර සභා කාර්යාල යෙන් ලබාගත් කුවිතාන්සියක් නැතුව කිසිම සතකු මැරීමට ඉඩ නොදිය යුතුයි:—

| | රු. ශ. |
|---|---|
| හරකුන් සඳහා එකකුට ... ... | 0 75 |
| බැටළුවන්, එළුවන් හෝ ඌරන් සඳහා එකකුට ... | 0 60 |

(ii) මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසු මෙහි 2 වැනි නියෝගය යටතේ සතකු අනුමත කර තිබෙන විට ඒ සතා මස් පිණිස සතුන් මරණ ස්ථානයට ඇතුල් කිරීමට ප්‍රථමයෙන් ගාස්තුව ගෙවූ බවට සාක්ෂ්‍යයක් වශයෙන් සුළු නගර සභා කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් පෙන්වා සිටීම වුවමනා නො කෙරෙයි.

(iii) මස් පිණිස සතුන් මරණ ස්ථානයට ගෙනෙන ලද සතෙකු නුසුදුසු යයි කියා ප්‍රතික්ෂෙප කළ විට හෝ ඌ මස් පිණිස මැරීම සුදුසු යයි අනුමත කිරීමෙන් පසුව මස් පිණිස සතුන් මරණ ස්ථාන යෙන් ඉවත් කළ විට හෝ,

(අ) එකී සතා සම්බන්ධයෙන් මේ නියෝගයේ 1 වැනි ඡේදය යටතේ ගෙවන ලද ගාස්තුව ද,

(ආ) සතුන් තබා ගැනීම සඳහා නියම කරන ලද ස්ථානය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් එකී සතා වෙනුවෙන්, එක් එක් පැය 24ක කාල සීමාවක් සඳහා ශත 30 බැගින්වූ ගාස්තුවක් ද,

සුළු නගර සභාව විසින් ගෙවිය යුතු වන්නේ ය.

11. සතුන් මරණ ස්ථානය භාර අය විසින් සතුන් මරණ ස්ථානයට ගෙන එන ලද සියලුම හරකුන්ගේ රෙජිස්ටරයක් මේ සමග තිබෙන පෝර්මයෙහි පරිදි තබාගත යුතුයි:

| හරක් කුවිතාන්සියේ නොම්මරය | පිස්තරය | පාට | වයස | හං නිවරණ | | මෙසර්නාගේ නම | හරක් කොටුවට ඇතුල්කළ වෙලාව සහ දිනය | පරීක්ෂාකර බැලූ දිනය ගෙනගිය දිනය | පරීක්ෂාකර බලන නිලධාරී තැනගේ කොට අත්සන | හරක් බාරගත්තා නිලධාරී තැනගේ කොට අත්සන | වැඩිපුර කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | දකුණු පැත්ත | වම පැත්ත | | | | | | |
| | | | | | | | | | | | |

12. 1940හේ සැප්තැම්බර් මස 6 වැනි දින අංක 8,659 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාපනතේ 22 වැනි වගන්තිය යටතේ වූ නියෝග, එහි සඳහන් "නීති රීති" වචනිය නගරයට පමණක් අදාළ වන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. මේ නියෝගවල—

"සභාපති තුමා" යනුවෙන් සුළු නගර සභාවේ සභාපතිතුමා අදහස් කරනු ලැබේ.

"සුළු නගර සභාව" යනුවෙන් වවුනියා සුළු නගර සභාව අදහස් කරනු ලැබේ.

"ආඥාපනත" යනුවෙන් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (201 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

---

## ගම්සභා ආඥාපණත—198 පරිච්ඡේදය

### හක්මන-වලකඩ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව

මාතර දිස්ත්‍රික්කයේ කන්දබඩ පත්තුවේ හක්මන-වලකඩ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහ ජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ජේ. රත්නායක,
හක්මන-වලකඩ ගම්කාර්‍ය සභාවේ සභාපති තැන.

ගම්සභා කාර්‍යාලය,
හක්මන, 30, අප්‍රේල්, 1960.

### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා පොදු අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වන වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ හක්මන-වලකඩ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් 1954 ක්වූ ජනවාරි මස 15 වෙනි දින අංක 10,632 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරණ ලද යෝජනාවෙන් සම්මත කර ගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වෙනි කාණ්ඩයේ 1 වෙනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග හා පළල අනුව සාද හෝ නැවත සාද පවත්වාගෙන යනු ලබන බව මෙයින් යෝජනා කරනු ලැබේ.

| පාරේ අංකය | කොට්ඨාශයේ නම | පාරේ නම | දිග දම්වැල් | පළල අඩි |
|---|---|---|---|---|
| 1 | කෝංගල | කෝංගල-නරවැල්පිට පාර | 139 | 14 |
| 2 | එම | කෝංගල-කරපුටුගල පාර | 88 | 14 |
| 3 | එම | කෝංගල-මිද්දෙනිගොඩ පාර | 120 | 12 |
| 4 | එම | කෝංගල-බෙරුවෙවෙල පාර | 60 | 4 |
| 5 | එම | කෝංගල-ලාල්පෙ පාර | 100 | 12 |
| 6 | එම | සේරුගහහේන-පන්සිල පාර | 28 | 12 |
| 7 | එම | කෝංගල-නාපැලේගොඩ පාර | 64 | 10 |
| 8 | එම | කෝංගල-සිලිබිලිකන පාර | 120 | 14 |
| 9 | එම | කෝංගල-කිරින්ද පාර | 86 | 14 |
| 10 | නරවැල්පිට දකුණ | ඇල්ලේවෙල-ගම්මැද පාර | 60 | 12 |
| 11 | එම | ඇල්ලේවෙල-නරවැල්පිට පාර | 86 | 6 |
| 12 | එම | ඇල්ලේවෙල-බමුණුගම පාර | 72 | 14 |

| පාරේ අංකය | කොට්ඨාශයේ නම | පාරේ නම | දිග දම්වැල් | පළල අඩි |
|---|---|---|---|---|
| 13 | නරවැල්පිට දකුණ | ඇල්ලේවෙල-තුඹේ පාර | 15 | 8 |
| 14 | නරවැල්පිට උතුර | නරවැල්පිට-පල්ලාවෙල පාර | 114 | 10 |
| 15 | එම | නරවැල්පිට-මුගුණදෙනිය පාර | 61 | 5 |
| 16 | එම | නරවැල්පිට-මුරුතාමුරේ පාර | 56 | 4 |
| 17 | එම | නරවැල්පිට-දෙනගම පාර | 189 | 14 |
| 18 | එම | කනත්තෙවත්ත-පොල්ගස්ලන්ද පාර | 86 | 8 |
| 19 | මුරුතාමුරේ | හක්මන-තිත්තමුගුණ පාර | 72 | 10 |
| 20 | එම | මුරුතාමුරේ-නරවැල්පිට පාර | 32 | 12 |
| 21 | එම | මුරුතාමුරේ-වේපතඉර පාර | 120 | 5 |
| 22 | එම | හක්මන-තුරුවාගොඩ පාර | 34 | 8 |
| 23 | එම | මුරුතාමුරේ-බෙරුවේවෙල පාර | 71 | 10 |
| 24 | දෙනගම බටහිර | දෙනගම-යබරකොස්ස පාර | 160 | 14 |
| 25 | එම | දෙනගම වැව හරහා පාර | 40 | 6 |
| 26 | එම | දෙනගම-ගංහේවාගොඩ පාර | 40 | 4 |
| 27 | දෙනගම නැගෙනහිර පාර | දෙනගම-කණුමුල්දෙනිය පාර | 165 | 14 |
| 28 | එම | දෙනගම-වේපතඉර පාර | 77 | 8 |
| 29 | එම | පැලවත්ත-බතලවත්ත පාර | 48 | 12 |
| 30 | එම | දෙනගම-පල්ලාවෙල පාර | 41 | 6 |
| 31 | එම | දෙනගම-කන්දෙබැද්ද පාර | 75 | 5 |
| 32 | මීඇල්ල | මීඇල්ල-වාව්ව පාර | 96 | 12 |
| 33 | එම | මීඇල්ල-යටිගල පාර | 84 | 10 |
| 34 | එම | මීඇල්ල-ගොඩවැන්න පාර | 3 | 14 |
| 35 | එම | මීඇල්ල-පල්ලිය පාර | 54 | 10 |
| 36 | පනන්වෙල | පනන්වෙල-යටිගල පාර | 22 | 12 |
| 37 | එම | පනන්වෙල-කොහුලියද්ද පාර | 86 | 10 |
| 38 | වේපතඉර | වේපතඉර-නරවැල්පිට පාර | 189 | 14 |
| 39 | එම | වේපතඉර-පනන්වෙල පාර | 204 | 14 |
| 40 | එම | පොල්කිරිපිටිය-වේපතඉර පාර | 56 | 10 |
| 41 | එම | වේපතඉර-මුරුතාමුරේ පාර | 60 | 8 |
| 42 | එම | හක්මන-මාන්ඩාකැලේ පාර | 9 | 8 |
| 43 | එම | වේපතඉර-දෙනගම පාර | 120 | 5 |
| 44 | කැබිලියපල | කැබිලියපල-පනන්වෙල පාර | 334 | 14 |
| 45 | එම | කැබිලියපල-වේපතඉර පාර | 81 | 10 |
| 46 | එම | පොල්කිරිපිටිය-කැබිලියපල පාර | 50 | 5 |
| 47 | එම | පොල්කිරිපිටිය-උඩුපිල්ලෙගොඩ පාර | 40 | 3 |
| 48 | එම | කඩුකන්න-උඩුපිල්ලෙගොඩ පාර | 20 | 3 |
| 49 | එම | කැබිලියපල-ආචාරිගෙවත්ත පාර | 52 | 10 |
| 50 | එම | කැබිලියපල ග්‍රාම සංවර්ධන පාර | 117 | 14 |
| 51 | කොහුලියද්ද | ගම්මැදපිටිය-සූරියගස්දෙනිය පාර | 156 | 14 |
| 52 | එම | කොහුලියද්ද-සූරියගස්දෙනිය පාර | 40 | 4 |
| 53 | එම | කොහුලියද්ද-කැබිලියපල පාර | 40 | 3 |
| 54 | එම | ඉදිගස්පිටිටෙනිය-පහළදෙනිය පාර | 20 | 4 |
| 55 | එම | කොහුලියද්ද-කරතොට පාර | 104 | 12 |
| 56 | ගංගොඩගම | වැවල-සූරියගස්දෙනිය පාර | 108 | 12 |
| 57 | එම | ගංගොඩගම-කෝංගහකුඹුර පාර | 80 | 4 |
| 58 | එම | ගංගොඩගම-ගැටමාන්න පාර | 141 | 14 |
| 59 | එම | ගංගොඩගම-අමංගල පාර | 67 | 12 |
| 60 | එම | පොත්තෙවෙල-කොහුලියද්ද පාර | 42 | 10 |
| 61 | එම | අමංගල-තාරපේරිය පාර | 22 | 10 |
| 62 | එම | පොත්තෙවෙල-කුඹල්ගොඩ පාර | 40 | 3 |
| 63 | එම | ගංගොඩගම-ලෝල්ලෙගොඩ පාර | 100 | 6 |
| 64 | එම | පොත්තෙවෙල-යටිගල පාර | 122 | 10 |
| 65 | කරතොට | ධර්මාරාම පාර (කරතොට-හෙට්ටියාවල) | 109 | 14 |
| 66 | එම | කරතොට-ඇල්දෙනිය පාර | 48 | 12 |
| 67 | එම | කරතොට-අඹගස්දෙනිය පාර | 15 | 14 |
| 68 | ලාල්පෙ | ලාල්පෙ-කරතොට පාර | 102 | 12 |
| 69 | එම | වටවන-හෙට්ටියාවල පාර | 107 | 8 |
| 70 | එම | උඩකුඹුර-හෙට්ටියාවල පාර | 100 | 8 |
| 71 | එම | පොකුදෙනිය-දහඅටකුරුණිය පාර | 38 | 8 |
| 72 | උඩුපිල්ලෙගොඩ | හක්මන-ලාල්පෙ පාර (ශ්‍රී සුධර්මාරාම) | 112 | 14 |
| 73 | එම | දිවෙල-කිරින්ද පාර | 100 | 10 |
| 74 | එම | උඩුපිල්ලෙගොඩ-කෝංගල පාර | 40 | 5 |
| 75 | කුඹල්ගොඩ | කුඹල්ගොඩ-පානමුල්ල පාර | 80 | 12 |
| 76 | එම | නාරද්ද-කරතොට පාර | 46 | 8 |
| 77 | එම | නාරද්ද-කුඹල්ගොඩ පාර | 30 | 8 |

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී.—බී 224/40/ඇල් ජී.ඩී.—ජීජ් 11/33/1.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ නැගෙනහිර මාතලේ ගඟල උඩසිය පත්තුවේ ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන ස හනිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථාවර ලේකම් තැන.

1960 ජූනි මස 20 වැනි දින,
කොළඹ දිය.

### අතුරු ව්‍යවස්ථා

මාතලේ දිස්ත්‍රික්කයේ නැගෙනහිර මාතලේ ගඟල උඩසිය පත්තුවේ ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1959 යේ ජූනි මස 12 වැනි දින අංක 11,771 දරණ ගැසට් පත්‍රයේ පළකරවන ලද සතුන් හා රථවාහන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, එහි "බී" උපලේඛනය අස්කොට ඒ වෙනුවට මෙහි පහත සඳහන් උපලේඛනය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

#### "බී" උපලේඛනය

| | |
|---|---|
| කරත්තයක් තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... | ජී.යූ.පී.වී.සී. "සී" |
| ඕනෑම අන්දමක සෑම බරකරත්තයක් (ගොන් දෙන්නා බඳින) හෝ තිරික්කලයක් සඳහා | ජී.යූ.පී.වී.සී. "ඩී" |
| සෑම බරබාග කරත්තයක් (තනි ගොනා බඳින) හෝ තිරික්කලයක් සඳහා ... | ජී.යූ.පී.වී.සී. "ඇස්" |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... | ජී.යූ.පී.වී.සී. "ආර්" |
| සෑම අත් කරත්තයක් සඳහා ... | ජී.යූ.පී.වී.සී. "එච්" |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | ජී.යූ.පී.වී.සී. "ඕ" |

---

ඇල්.ජී.ඩී.—ජී.බී 14/25/3.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ මඩිහ-ගොඩගම ගම්ප්‍රදේශයේ ගම් කාර්ය සභාව විසින් සම්පාදිතව 1,947 සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන හ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය
කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 වේ ජූනි මස 14 වැනි දින,
කොළඹ දිය.

### අතුරු ව්‍යවස්ථා

කාර්ය සභාව විසින් සම්මත කරගන්නාලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 12 වැනි කාණ්ඩයේ ඇති අතුරු ව්‍යවස්ථාවල 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, එකී අතුරු ව්‍යවස්ථා යටතේ කලින් අවලංගු කරන ලද්දේ නම් මිස නැති නම්, එකී බලපත්‍රය නිකුත් කරන ලද අවුරුද්දේ දෙසැම්බර් මස 31 වැනි දයින් එය අවසන් වන්නේ ය.

2. කාර්ය සභාව විසින් සම්මත කරගන්නා ලද අතුරු ව්‍යවස්ථාවල 10, 11, 12, 13, 18 හා 22 වැනි කාණ්ඩවල ඇති අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් සඳහාවූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම, කාර්ය සභාව විසින් සපයා ඇති ආකෘති පත්‍රයේ ප්‍රකාරයට සකස්විය යුතුවාත් හැර:—

(අ) එකී ඉල්ලුම් පත්‍රය අළුත් බලපත්‍රයක් සඳහානම්, එම බලපත්‍රය අවශ්‍ය ව්‍යාපාරය පටන් ගැනීමට අදහස් කරන දිනට නො අඩු තිස් දිනකට කලින් හා,

(ආ) එකී ඉල්ලුම් පත්‍රය දැනට තිබෙන බලපත්‍රයක් අළුත් කිරීම සම්බන්ධයෙන් නම්, එම අළුත්කිරීම අවශ්‍ය අවුරුද්දට කලින් අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ පහළොස් වැනි දිනට හෝ ඊට මත්තෙන් ද, සභාපතිතුමා වෙත ලැබෙන්ට සැළැස්විය යුතු වන්නේ ය.

3. මේ අතුරු ව්‍යවස්ථාවල, "සභාපතිතුමා" යනුවෙන් කාර්ය සභාවේ සභාපතිතුමා අදහස් කරනු ලැබේ;

"කාර්ය සභාව" යනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ මඩිහ-ගොඩගම ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

---

ජී. බී 14/17/8.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ හිනිදුම ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින දරණ අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා,

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 ජූනි මස 14 වැනි දින,
කොළඹ දිය.

### අතුරු ව්‍යවස්ථා

#### නිලධරින් සහ මෙහෙකරුවෝ

1. කාර්යසභාවට එන්නට තිබෙන සියලුම අයබදු සහ ගාස්තු එකතු කොට කාර්යසභාවේ මුද්‍රාව සහ සභාපති තුමාගේ අත්සනෝ නිවරදි පිටපත ඇති මුද්‍රිත කුවිතාන්සි නිකුත් කිරීම පිණිස ප්‍රධාන තුමා විසින් ඕනෑම නිලධාරියෙකුට හෝ වෙනත් කෙනෙකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිය.

2. කිසිවෙකු විසින්—

(අ) ගම්සභා ආඥපනතෙන් හෝ ඒ ආඥපනතේ හෝ එය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවල හෝ යම් විධි විධානයක් යටතේ ප්‍රධාන තුමා කෙරෙහි හෝ කාර්ය සභාවේ වෙනත් යම් නිලධාරියෙකු කෙරෙහි හෝ පැවරී ඇති යම් බලයක් පාවිච්චි කිරීමේදී හෝ පනවා ඇති යම් යුතුකමක් ඉෂ්ට කිරීමේදී හෝ නියම කොට ඇති යම් කාර්යයක් ක්‍රියාවේ යෙදීමේදී එකී ප්‍රධානතුමාට හෝ නිලධාරියාට, හෝ

(ආ) කාර්යසභාවෙන් කාර්යසභාව වෙනුවෙන් රක්ෂාවේ යොදා ගන්නා ලද යම් මෙහෙකරුවෙකුට හෝ යම් වැඩකරුවෙකුට ප්‍රධාන තුමා විසින් හෝ කාර්ය සභාවේ වෙනත් යම් නිලධාරියෙකු විසින් නීති ප්‍රකාර පවරා තිබෙන යම් යුතුකමක් ඉෂ්ට කිරීමේදී ඒ මෙහෙකරුවාට හෝ වැඩකරුවාට හෝ ඕනෑකමින් බාධා නොකළ යුතුයි.

3. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධාන තුමා" යනුවෙන් කාර්ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ;

"කාර්ය සභාව" යනුවෙන් ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ;

"ආඥපනත" යනුවෙන් ගම්සභා ආඥපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ;

"ගම්ප්‍රදේශය" යනුවෙන් ගාලු දිස්ත්‍රික්කයේ හිනිදුම ගම්ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

ඇල් ඕ.—ඕ. 102/45.
ඇල්.ජී.ඕ.—ජීඑච්. 11/36

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලේ ගම්පහ ගම් ප්‍රදේශයේ ගම්කාය්‍යී සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසැට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පලාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමති තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාය්‍යාංශයේ
ස්ථාවර ලේකම් තැන.

1960 ජූනි මස 14 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

#### අන්තරාදායක වූ හා අප්‍රසන්න වූ කර්මාන්ත

1. පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදායකවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) පිදුරු ගබඩා කිරීම
(2) කබුක්ගල්, බොරලු හා කළුගල් ලබාගැනීමට වළවල් තැනීම හෝ වළවල් තබා ගැනීම
(3) කපු පුලුන් නූල් ආදිය ගබඩා කිරීම
(4) ලී මඩුවක් තබා ගැනීම
(5) දරමඩුවක් තබා ගැනීම
(6) භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම
(7) සවර්ණාභරණ සෑදීම
(8) කම්හලක් තබා ගැනීම
(9) මුද්‍රණ යන්ත්‍රාලයක් තබා ගැනීම
(10) තේ කර්මාන්ත ශාලාවක් තබා ගැනීම
(11) අම්ලකර වායුව පාවිච්චි කරන ඕනෑම කම්හල් කර්මාන්තයක්
(12) හාල් මෝලක් තබා ගැනීම.

2. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්න කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කුකුළු තාරාදි පක්ෂීන් විකිණීම පිණිස ස්ථානයක් තබා ගැනීම
(2) ජාඩි හෝ කරවල ගබඩා කිරීම
(3) තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුලු ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම
(4) කොම්පෝස්ට් පෝර හෝ කෘතිම පෝර සෑදීම
(5) සබන් සෑදීම
(6) හම් පදන් කිරීමේ ස්ථානයක් තබා ගැනීම
(7) සතුන්ගේ හම් ගබඩා කිරීම
(8) සතුන්ගේ ඇටකටු ගබඩා කිරීම
(9) රබර් ෂීට්, ක්‍රෙප් රබර් දුන් ගැස්සීම හෝ සෑදීම
(10) කෘත්‍රිම පෝර හෝ කෘත්‍රිම පෝර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා තබා ගැනීම
(11) කෝඩා සෑදීම
(12) දුන්කල වියලා සකස් කිරීම
(13) සුරුට්ටු කර්මාන්තය
(14) පැනි හෝ හකුරු කර්මාන්තය
(15) බීඩි කර්මාන්තය
(16) රා එකතු කිරීමේ ස්ථානයක් තබා ගැනීම
(17) විනාකිරි සෑදීම

3. පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදායකවූ හෝ අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කෙඳි සායම් කිරීම
(2) ගඩොල් පිලිස්සීම
(3) බැටරි චාජ් කිරීම
(4) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි කිරීම

---

ඇල්.ජී.ඕ.—ජීසී. 14/62.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ උඩියන්කුලම කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිත වූ, එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථාවර ලේකම් තැන.

1960 මැයි 25 දින කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

වෂී 1953 ජනවාරි 9 වැනි දින අංක 10,488 දරන ගැසට් පත්‍රයෙහි පළවූ, අප්‍රසන්න හා අන්ත්‍රාදායකවූ කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා, එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට මෙහි පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව යෙදීමෙන් මෙයින් සංශෝධනය කර සිටිනු ලැබේ.

(1) පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

ජාඩි හෝ කරවල ගබඩා කිරීම,
තොග ගණනේ හෝ සිල්ලර වශයෙන් විකිණීම පිණිස නරක් විය හැකි ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම,
කොම්පෝස්ට් නොහොත් කෘත්‍රිම පොහොර සෑදීම,
විනාකිරි සෑදීම,
සබන් සෑදීම,
දුම්කොළ වියලීම හෝ සකස් කිරීම,
හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම,
පුවක් වියළා සකස් කිරීම,
සතුන්ගේ ලේ හෝ මලකුණු හෝ උණු කිරීම,
ඇටකටු හෝ හම් ගබඩා කිරීම,
රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හෝ සෑදීම,
කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම,
කෝඩා සෑදීම,
ලැලි පොගවා සකස් කිරීම,
මාළු අයිස් දැමීම,
සුරුට්ටු සිගරට් හෝ බීඩි සෑදීම,
පැනි හෝ හකුරු සෑදීම,
ලී බඩු සෑදීම,
ගෝනි ගබඩා කිරීම,
කෙඳි වර්ගවලින් හෝ කොහුවලින් සාදන ලද බඩු ගබඩා කිරීම,
මස් ලුණු දැමීම හෝ වියලීම,
තලතෙල් සෑදීම,
වේවැල් බඩු සෑදීම,
හිස් බෝතල ගබඩා කිරීම,
තෙල් ගබඩා කිරීම,
වඩු මඩුවක් තබා ගැනීම,
දර මඩුවක් හෝ ලී මඩුවක් තබා ගැනීම,
දුම්කොළ ගබඩා කිරීම,
සබන් ගබඩා කිරීම,
ගඩොල් හෝ උළු ගබඩා කිරීම,
බෙලෙක් වැඩ පොළක් තබා ගැනීම,
මිණී පෙට්ටි සෑදීම හෝ ගබඩා කිරීම,
තීන්ත හෝ වාර්නිස් ගබඩා කිරීම,
පරණ යකඩ බඩු ගබඩා කිරීම,
පුන්නක්කු ගබඩා කිරීම,
සිමෙන්ති ගබඩා කිරීම,
මේද වර්ග නිපදවීම.

(2) පහත සඳහන් කර්මාන්ත අන්තරායදායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

කොප්පරා සෑදීම,

තෙල්වලින් හෝ වාෂ්ප බලයෙන් හෝ දැවෙන ද්‍රව්‍ය වලින් හෝ විදුලි බලයෙන් ක්‍රියා කරන යන්ත්‍ර පාවිච්චි කරන යම් කර්මාන්තයක්,

කබොක්, කළුගල් හෝ බොරළු ලබාගැනීමට වළවල් කැපීම,

මිනිරන් වියලීම හෝ ගබඩා කිරීම,

වළක් කැණීමෙන් හුණුගල් ලබාගැනීම,

වී මෝලක් හෝ හාල් පාගින යන්ත්‍රයක් තබා ගැනීම,

යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් සිඳීම,

සෙක්කුවකින් පොල්තෙල් සිඳීම,

කෙඳි වර්ග සෑදීම හෝ ගබඩා කිරීම,

කපු පුළුන් හෝ පිදුරු ගබඩා කිරීම,

බූමිතෙල් ගබඩාවක් තබා ගැනීම,

මුද්‍රණාලයක් තබා ගැනීම,

කපාපු පොල් සෑදීම,

සවර්ණාභරණ සෑදීම,

අම්ලකර වායුව යොදා ලෝකුරු වැඩ කිරීම,

අම්ලකර වායුව පාවිච්චි කරන ස්ථානයක් තබා ගැනීම,

කොප්පරා ගබඩා කිරීම,

කම්මලක් තබා ගැනීම,

අඟුරු ලබා ගැනීම සඳහා පොල්කටු පිළිස්සීම,

ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කරන ස්ථානයක් තබා ගැනීම,

විදුලිය වැඩ පොළක් තබා ගැනීම,

යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් මිරිස් හෝ කුළුබඩු අඹරන ස්ථානයක් තබා ගැනීම,

කළුගල් පිපිරවීම හෝ ගල් කැඩීම,

ලී ඉරීම,

මෝටර් රථ හෝ ලොරි මෝටර් බයිසිකල් හෝ පාගන බයිසිකල් සර්විස් කරන ස්ථානයක් තබා ගැනීම,

වී, කුරක්කන් හෝ වෙනත් ධාන්‍ය වර්ග යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් කෙටීම.

(3) පහත දක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ අන්තරායදායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

කෙඳි වර්ග සායම් කිරීම,

ගඩොල් හා උළු සෑදීම,

බැටරි චාජ් කිරීම,

හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි කිරීම,

එළුවන් 10කට වැඩි දෙනෙකු සඳහා මඩුවක් තබා ගැනීම.

---

# අය-වැය ලේඛන

## හොරණ පළාත් ආණ්ඩු සභාව

### 1960 වර්ෂයේ දෙවැනි අතිරේක අය-වැය ලේඛනය

| වැය ශීර්ෂය හා අනු ශීර්ෂය | මුදල<br>රු. ශ. | අවසරය |
|---|---|---|
| බී.—මහාමාර්ග ... ... ... ... | 1,960 00 | ... 1960.5.7 වන දින යෝජනා අංක 6 |
| (2) නඩත්තු කිරීම ... ... ... | 1,000 00 | ... 1960.5.7 වන දින යෝජනා අංක10 |
| ඊ.—මහජන සනීපාරක්ෂාව :— | | |
| (1) සාමාන්‍ය— | | |
| (ජී) කාණු ඉදිකිරීම ... ... ... ... | 3,610 00 | ... 1960.4.2 වන දින යෝජනා අංක 4 |
| (2) කුණු ඉවත් කිරීම— | | |
| (බී) කරත්ත ගොනුන් සහ ලොරි ... ... ... | 450 00 | ... 1960.6.4 වන දින යෝජනා අංක 8 |
| ඇම්.—කියවීම් ශාලා හා පුස්තකාලය :— | | |
| (3) ලී බඩු ... ... ... ... | 7,200 00 | ... 1960.5.7 වන දින යෝජනා අංක 6 |

1960 අප්‍රියෙල් මස 2 වන දින, 1960 මැයි මස 7 වන දින සහ 1960 ජූනි මස 4 වන දින පවත්වන ලද රැස්වීම්වලදී සම්මත කෙරුණි.

ඩබ්ලිව්. ඇම්. පොන්සේකා,
සභාපති,
හොරණ නගර සභාව

නගර සභා කාර්යාලය,
හොරණ, 17.6.60.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත **සම්පූර්ණ** ගාස්තුවත් සමග **කොළඹ රජයේ** මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ රෙජිස්ට්‍රාර් මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම **පස්වරු 3.30ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ රජයේ** ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.